# School Canteen Policy

# 2006

## Ministry of Education
## Ministry of Health

Democratic Socialist Republic of Sri Lanka

School Canteen Policy 2006

## Introduction

About twenty five percent of the Sri Lankan Population comprised of school children and nutritional status of them has a significant influence over their educational performances. Since the school environment has a great potential to influence many lifestyle choices of school children, focus on school canteen is mandatory to improve their nutritional status.

## School Canteen Policy

The broad aim of the School Canteen Policy is to optimising the educational performance among school children by improving their nutritional status

In this respect the Government has identified the following areas needing focused attention.

Need for school canteens in all larger schools (children >200), involvement of school community over canteen conduct, making the canteens available with nutritious food, maintenance of proper hygiene, prevention of food related disorders among students and development of healthy dietary habits among them

Measures will be taken to optimise the educational performance among school children by improving their nutritional status by drawing attention to above mentioned areas and adopting following strategies.

1. The government will ensure the right of school children to have nutritious, culturally acceptable food available at a reasonable cost within the school premises.

2. Ensure hygiene of the food provided.
3. Facilitate school children to get their meals during the school hours.
4. Develop the school canteen as a health-promoting centre as an integral part of the health promoting school
5. Promote child friendly service provision at school canteens
6. Allocate necessary funds to improve the facilities of school canteens.
7. Support & strengthen Human Resource Development to improve the quality of services to a level acceptable to the consumer
8. Build up a regular monitoring system with the participation of relevant officers in both health and education sector in all National, Provincial, District, Zonal & Divisional levels.
9. Take every opportunity to develop healthy dietary habits among school children by improving their knowledge, attitudes and practices over diet
10. Evaluation at national level to assess the achievement of the broad aims of the policy.

Implementation

The school canteen policy will be implemented through the Central and Provincial ministries of Education.

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாய'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ....................

මගේ අංකය / எமது இல. / My No. ED/1/21/1/1/1

දිනය / திகதி / Date 2007.01.10

චක්‍රලේඛ අංක ...2007/02...........................

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලු ම විදුහල්පතිවරුන් වෙත

පාසල්වල ආපන ශාලා පවත්වාගෙන යාම.

සෞඛ්‍ය හා පෝෂණය සිසු සංවර්ධනය හා සාධනය කෙරෙහි බලපාන සාධකයන් වන අතර පසුගිය වසරවල අධ්‍යයනයන් තුළින් පාසල් සිසුන් විවිධ පෝෂණ ගැටලු හා වැරදි ආහාර පුරුදුවලට ලක්වී ඇති බව අනාවරණය වී තිබේ. මන්ද පෝෂණය 21%ක් ද ස්ථූලතාව 10% ක් ද වයසට නියමිත උස නොමැතිකම 15.1%ක් ද වයසට නියමිත බර නොමැතිකම 29%ක් ද පවතින අතර පාසල් යන වයසේ යෞවනයන් සම්බන්ධයෙන් මෙම ගැටලුව වඩාත් තීව්‍ර ව පවතින බව ත් දියවැඩියා රෝගය පාසල් සිසුන් අතර වැඩි වෙමින් පවතින බව ත් සෞඛ්‍ය පර්යේෂණ වාර්තා මගින් පෙන්වා දී තිබේ.

2006 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික පෝෂණ ප්‍රතිපත්තියට අනුව සෑම පුද්ගලයකුට ම අවම පෝෂණ මට්ටම් ආවරණය වන පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින් යුක්ත ව ආහාර ලැබෙන බවට සහතික වීම අවශ්‍ය වේ. ජාතික පෝෂණ ප්‍රතිපත්තියේ එක් අරමුණක් වනුයේ පාසල් සිසුන් අතර නිවැරැදි ආහාර හා පෝෂණ පුරුදු ඇති කිරීම හා නිවැරැදි දැනුම ලබා දීම ය. මෙහිදී ආහාර බහුලතාව. සුරක්ෂිතභාවය. සාධාරණ මිල ගණන් යටතේ මිලදී ගැනීමේ හැකියාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

මේ අනුව 2007 ජනවාරි මස ඇරඹෙන නව පාසල් වාරයත් සමග පාසල් වල ආපන ශාලා හා පාසල් පරිසරය තුළ ආහාර සැපයීමේ දී පහත සඳහන් තීරණායක අනුව ක්‍රියාකිරීම අපේක්ෂා කෙරේ.

1 සෑම පාසලක ම සිසුන්ට ආහාර ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම.
2 ආහාර සපයන ස්ථාන භාවිත කරන උපකරණ වල පවිත්‍රතාව පිළිබඳ සහතික වීම.
3 සපයනු ලබන ආහාරවල සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂිත බව පිළිබඳ සහතික වීම.
4 පෝෂණයට හිතකාමී විවිධ ආහාර ලබා ගැනීමේ අවස්ථා ලබා දීම.
5 හිතකාමී පෝෂණ හා ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම.
6 සෞඛ්‍ය හා පෝෂණයට හානි කර ආහාර විකිණීමෙන් වැළකීම.
7 ආපන ශාලාව තුළ හා අවට පරිසරය පවිත්‍රව තිබීම.

මේ අනුව පහත සඳහන් උපදෙස් පිළිපැදීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

- කාබනීකෘත බීම වර්ග(Fizzy drink) පැණි බීම, අධික තෙල්/ සීනි/ලුණු සහිත ක්ෂණික ආහාර හා ඇලෙන සුලු ටොෆි වර්ග විකිණීම නො කළ යුතු ය.
- සෞඛ්‍යයට හානි කර තෙල් සහිත ආහාර සහ සීනි සහිත ආහාර විකිණීම සීමා කළ යුතු ය.
- පලතුරු වර්ග, දියර කිරි, බත්, මුංඇට, කඩල, කව්පි වැනි වෙනත් පෝෂ්‍යදායී හා දේශීය ආහාර වර්ග විකිණීම ප්‍රවර්ධනය කළ යුතු ය.
- ආපන ශාලාව සහ අවට පරිසරය ක්‍රමානුකූල ව පවත්වා ගත යුතු අතර පිරිසිදු පානීය ජලය ලබාදීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය.

මෙම කාර්යය පිළිබඳ ව සොයා බැලීම සඳහා පාසල් මට්ටමෙන් කමිටුවක් පත් කර ගත හැකිය.

පාසල් ආපන ශාලා නියාමන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.
විදුහල්පති
නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන)
ගුරු මහත්ම/මහත්මීන්ගෙන් එක් අයකු
පාසල් සංවර්ධන සමිතියේ සමාජිකයකු
ආදි ශිෂ්‍ය සමිතියේ සමාජිකයකු/ සුබ පතන්නකු
මහජන සෞඛ්‍ය පරීක්ෂක

කමිටුවේ කාර්ය භාරය ලෙස ආහාරවල හා පරිසරයේ සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආහාර සැපයුම් කරුවන් තිරණය කිරිමේ දී ආහාරවල ගුණාත්මක බව හා ආහාරවල සුරක්ෂිත භාවය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

පාසල් ආපනු ශාලාව තුළෙක් පාසලට ආදායම් ලැබෙන ස්ථානයක් පමණක් නො විය යුතු අතර සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණය නගා සිටුවීමට දායක වන පරිදි සැලසුම් කළ යුතු ය.

ආපන ශාලාවෙන් ලැබෙන ආදායම පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කළ යුතු ය.
පාසල් පරිසරය තුළ සෞඛ්‍යයට හා පෝෂණයට හිතකාමී ලෙස ආහාර සැපයීම සිදු වන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක ගේ වාර්තාවක් ලබා ගැනීම වඩාත් සුදුසු වේ.

ඉහත උපදෙස් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් පාසල් සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ මට්ටම ප්‍රවර්ධනය වන ආකාරයට පාසල්වල ආපන ශාලා පවත්වාගෙන යාමට අවධානය යොමු කරවමි.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය